# වැඩ බැරි දූස ගැන කතා

නිකොලායි නෝසව්




5



## සෝඩා වතුරෙන් දුවන රියෙන්
# වැඩ බැරි දූස
# ගමන් ගිය සැටි

රාදුගා ප්‍රකාශකයෝ · මොස්කව්



වැඩ බැරි දූස ගැන කතා

5

නිකොලායි නෝසව්

# සෝඩා වතුරෙන් දුවන රියෙන් වැඩ බැරි දූස ගමන් ගිය සැටි

අනුවාදය – දැදිගම වි. රුද්රිගු

චිත්‍ර – බරීස් කලෞෂින්



දේදුන්න (රාදුගා) ප්‍රකාශකයෝ
මොස්කව්






යාන්ත්‍ර ශිල්පී ඉස්කුරුප්පුවා සහ ඔහුගේ අත්උදවුකාරයා වන මුරිච්චියා බොහොම දක්ස වැඩකාරයෝ. දෙන්නගෙම මූණුවර එකවගෙයි. ඉස්කුරුප්පුවා පොඩ්ඩක් උසයි, මුරිච්චිය චූට්ටක් මිටියි. දෙදෙනාම සම් කබා ඇඳලා. ඒ ගොල්ලන්ගේ සාක්කු වල අඬු, පීරි, ඉස්කුරුප්පු, නියන් ආදිය තිබුණා. ඔවුන්ගේ කබා සමින් මහපු ඒවා නිසා ඔය උපකරණ වල බරට ඔරොත්තු දුන්නා. නැතිනම් ඒ ඇඳුම් ඉරිලා බොහොම කල්. ඒ දෙදෙනාම සමින් හදපු හිස්වැසුම් පැළඳ සිටියා. ඇස් ආරක්සා වෙන කණ්ණාඩි ඇඳගෙන තමයි මේ දෙදෙනා වැඩ කරන්නේ.

මේ දෙදෙනා වාමනයින්ගේ පැට්රොල් ලාම්පු, ලෝහ හට්ටි, කේතල, ආදි දේ අලුත් වැඩියා කරනවා. ඒ වගේ වැඩ නැති වෙලාවට රෝද තුනේ පා පැදි වැනි දේ හදනවා.


ඔන්න හිටි හැටියේම ඉස්කුරුප්පුවායි, මුරිච්චියයි, කම්මලේ දොර වහගෙන හොර රහසේ මොනවදෝ හදන්ට පටන් ගත්තා. මාසයක් තිස්සේම ඒ ගොල්ල වැඩ කළා: පැස්සුවා, පීරි ගෑවා, මුරිච්චි ඇණ සවි කළා; කාටවත් ඒ ගොල්ලන්



හදන දේ පෙන්නුවේ නැහැ. පස්සෙ බැලින්නම් ඒ ගොල්ල හදලා තියෙන්නේ මෝටර් රියක්.

ඒ අපූරු මෝටර් රිය දුවන්නේ පැට්රෝල්, ඩීසල් වැනි තෙල් වලින් නොවෙයි. සිරප් සහිත සෝඩා වතුර වලින්. රිය මැද පදවන්නාගේ ආසනය. ඊට ඉස්සරහින් සෝඩා වතුර සහිත පීප්පය. ඒ සෝඩා වතුරෙන් පැන නගින ගෑස් වායුව, තඹ සිලින්ඩරයට ඇතුළු වෙනවා. ගෑස් වායුවේ බලය යකඩ පිස්ටනය තල්ලු කරනවා. මෙලෙස පිස්ටනය ක්‍රියාකාරී වීම නිසා රියේ රෝද කැරකැවෙන්නට පටන් ගන්නවා. රිය පදවන්නාගේ ආසනයට ඉහළින් සිරප් ටැන්කිය සවිකරලා. සිරප් බටය දිගේ ගිහිල්ලා පීප්පයට වැටෙනවා. එය යන්ත්‍රයට තෙල් වාගේ පාවිච්චි වෙනවා.

කුසුම් පුරයේ වාමනයන් අතර ඒ වගේ සෝඩා වතුරෙන් දුවන මෝටර් රිය බොහොම තිබුණා. ඉස්කුරුප්පුවායි, මුරිච්චියයි හදාපු මෝටර් රියේ ඉතා වැදගත් අලුත් දෙයක් ඇත. එය තමයි, ඒ ගොල්ලන්ට ඕන වෙලාවට මී පැණිවලින් හදාපු සිරප් සමග සෝඩා බීම සඳහා විශේෂ රබර් නලයක් සාදා තිබීම. ආසනයේ වාඩිවෙලා සිරප් සහ සෝඩා බොන්නට පුළුවනි.





කඩිනම් රාළ මේ මෝටර් රිය පැදවීමට ඉගෙන ගත්තා. කාටවත් ඕන වුනාම එයා බොහොම ආසාවෙන් මෝටර් රියෙන් ඒ ගොල්ලන්ට ඕන තැනට ඔවුන්ව ගෙන යනවා.

මී පැණි ආස නැමැති වාමන කොල්ලා අනිත් අයට වැඩිය ඔය රියෙන් යාමට ආසයි. මොකද දන්නවද එයාට ආසනයේ වාඩි වෙලා පැණි සිරප් එක්ක සෝඩා වතුර බොන්ට පුළුවන් නිසා. වැඩ බැරි ආසත් නිතර පාහේ ඔය මෝටර් රියෙන් ගමන් කළා. කඩිනම් රාළ තමයි රිය පදවන්නා. තනිවම රිය පැදවීමට වැඩ බැරි ආසට ලොකු ආසාවක් ඇතිවුනා. එයා කඩිනම් රාළට කතා කරලා මෙහෙම කියුවා:

''කාර් එක මට දීපන්. මාත් කැමතියි කාර් එක එළවන්ට.''

''නුඹට බැහැ. මේක යන්තරයක්. මේ යන්තරේ ගැන දැනීමක් තියෙන්ට ඕන,'' කඩිනම් රාළ එයාට විරුද්ද වුනා.

''දැන ගැනීමට තරම් දෙයක් ඔතන නැහැ. නුඹ එළවන හැටි මම දැකලා තියෙනවා. ගියර් දානවා, සුක්කානම කරකවනවා. එච්චරයි නොවැ. ඕකත්



අමාරු වැඩක්ද?'' වැඩ බැරි දාස කියුවා.

''බැලූ බැල්මට නම් අමාරු නොවෙයි වගේ තමයි පෙනෙන්නේ. නමුත් රිය පැදවීම අමාරුයි. නුඹ ඉගෙන ගන්නේ නැතුව එළවන්ට පටන් ගත්තොත්, කාර් එකත් කඩා බිඳ දමලා, නුඹත් මැරිල යාවි,'' කඩිනම් රාළ කියුවා.

''නුඹ මට ඔහොමද සලකන්නේ! හොඳයි, කමක් නැහැ. නුඹත් කවදහරි මගෙන් උදව්වක් ඉල්ලුවොත්, මමත් නුඹට උදව් දෙන්නේ නැහැ.''

දවසක්දා කඩිනම් රාළ ගෙදර හිටියේ නැති වේලාවෙක වැඩ බැරි දාස ගෙවත්තේ නවත්වා තිබුණු මෝටර් රියට නැගලා ගියර් අදින්ටයි, පැඩල් පාගන්ටයි පටන් ගත්තා. මුලදී රිය එක තැනම තිබුණේ හෙළවෙන්නේ වත් නැතුවයි. එහෙත් හිටි හැටියේම මෝටර් රිය හඬක් පිටකරලා දුවන්ට පටන් ගත්තා. වාමනයෝ කවුළුවෙන් මේක දැකලා ගෙවල් වලින් එළියට දුවගෙන ආවා.

''ඒයි, මෝඩයා, නුඹ මොනවා කරනවද? පණ නහගන්ට හදනවද?'' ඒ ගොල්ල කෑ ගැහැව්වා.

''නුඹලා. බය වෙන්ට එපා! මම පණ නහගන්ට තරම් මෝඩයකු නොවෙයි.''



මෙහෙම පුරසාරම් දෙඩුවා විතරයි වැඩ බැරි ආස එළවපු මෝටර් රිය ගෙවත්තේ තිබුණු බලු කූඩුවේ හැප්පුනා.

''අඩිං, බිඩිං, ඩෝං!'' බලු කූඩුව සුනේ සුන්. බුල්කා හොඳ වෙලාවට එළියට පැන්නා. බලු කූඩුවේ අයිතිකාර බල්ලගෙ නම බුල්කා.

''නුඹ කරන විනාශයක හැටි බලාපන්! වහාම කාර් එක නවත්වාපන්!'' දක්ස පාල කෑගැහුවා.

වැඩ බැරි ආස බයවෙලා මෝටර් රිය නැවැත්වීමට උත්සාහ ගත්තා. එයා මොකක්දෝ යතුරක් කැරකැව්වා විතරයි, මෝටර් රිය තවත් වේගයෙන් දුවන්ට පටන් ගත්තා. ගෙවැටත් සුනේ සුං! අඩිං, බිඩිං, ඩෝං! වැඩ බැරි ආසගේ ඇඟ පුරාම ලී පතුරු. එක ලී පතුරක් පිටට ඇනිලා. හිසේ පසුපසට තවත් ලී පතුරක් ඇනිලා.

වැඩ බැරි ආස සුක්කානම කරකවනවා. රිය ගෙවත්ත වටේට දුවනවා. වැඩ බැරි ආස බොහොම බියවෙලා යටි උගුරෙන් කෑ ගහනවා:

''අනේ සෝයුරනි! දොර ඇරපල්ලා! නැතිනම් ගෙවැට කුඩේ කුඩු වේවි!





වාමනයෝ ගෙවත්තේ දොර ඇරියා විතරයි මෝටර් රිය මහ පාර දිගේ වේගයෙන් දුවන්ට පටන් ගත්තා. මේ සද්දෙට මහා පාරට දුවගෙන ආපු අය දෙපස පෙළ ගැහිලා කෑ ගහන්ට වුනා.

''පණ බේරාගනියව්!'' වැඩ බැරි දාස මෝටර් රියෙහි වාඩි වෙලා කෑ ගහනවා.

දක්ස පාල, ඇනුම් හරින්නා, ඉස්කුරුප්පුවා, එඬරු තෙල් දොස්තර සහ අනෙක් වාමනයෝ මෝටර් රිය පසු පසින් දුවගෙන ගියහ. කොහේ දුවන්ටද! මෝටර් රිය වේගයෙන් ඉදිරියට ගියා.

පාර දිගේ දුවන රිය නැවැත්වීමට වැඩ බැරි දාස දන්නේ නැත.

ඔන්න අන්තිමේදී මෝටර් රිය ගඟ අද්දර පාරේ පල්ලමට ආවා විතරයි, තුන් කුන්දුන් ගැහිලා පෙරළුනා. රියෙන් පිටතට වීසිවෙලා ගිය වැඩ බැරි දාස සිහි නැතුව බිම ඇද වැටුනා. සෝඩා වතුරෙන් දුවන මෝටර් රිය ගඟට වැටිලා ගිලුණා.





අක්ස පාලයි, ඇනුම් හරින්නායි, ඉස්කුරුප්පුවායි, එඬරු තෙල් දොස්තරයි වැඩ බැරි ආසව අල්ලා ගත්තා. එයා සිහිය නැතුව වැතිරීලා හිටිය නිසා එයා මැරුණා කියලා මේ හතර දෙනා කල්පනා කළා. එයාව ඔසවාගෙන ගෙදර ගෙනවා.

එයාව ඇඳක දැම්මා විතරයි, එයාට සිහිය ආවා. එයා ඇස් දෙක ඇරලා වටපිට බලලා, මෙහෙම ප්‍රශ්න කරනවා:

''අනේ සෝයුරනි, මම පීවතුන් අතරද?''

''ඔවු. නුඹ පීවත් වෙනවා. නමුත් නුඹේ ඇටකටු, ඇඟ පත පිරික්සා බලන්ට ඕන. දඟලන්නේ නැතුව ඉඳපන්,'' එඬරු තෙල් දොස්තර කියුවා.

දොස්තර වැඩ බැරියාගේ ඇඳුම් ගළවලා පරීක්සා කරලා මෙහෙම කියුවා:

''පුදුමයක හැටි නුඹේ ඇටකටු කැඩිලා නැහැ. ඇඟ විතරක් සීරීලා තියෙනවා. ලී පතුරු ඇඟට ඇනිලා තියෙනවා. එච්චරයි.''

''ඔව්, ලොකු ලී කැල්ලක් මගේ පිටට ඇලුනා,'' වැඩ බැරි ආස කියුවා.

''ලී පතුරු ඉඳිකටු වගේ ඇඟට කා වැදිලා. ඒවා ගළවා දමන්ට ඕන,'' දොස්තර එහෙම කියලා හිස වැනුවා.



''මට වේදනාවක් ඇතිවෙයිද?'' බයවුණු වැඩ බැරියා ඇහුවා.

''චුට්ටක්වත් රිදෙන්නේ නැහැ! මම ලොකුම ලී පතුර ඇදලා ආන්නම්.''

''අයියෝ! රිදෙනවෝ!'' වැඩ බැරියා කෑ ගැහුවා.

''මොන බොරුද? කොහේ රිදෙනවද?'' දොස්තර පුදුම වුනා.

''අනේ, අනේ, බොහොම රිදෙනවෝ!''

''ඉවසාගෙන හිටපන්. රිදෙන්නේ නැහැ. නුඹ වේදනාව සිතින් මවා ගන්නවා,'' දොස්තර ඔහුට සැරවුනා.

''අපොයි, නැහැ. හැබැටම රිදෙනවා!''

''නුඹ කෑ ගහන්නේ මොකද? මම නුඹව කපනවද? මම නුඹව කැපුවේ නැහැ.''

''රිදෙනවෝ! දොස්තර කියුවට රිදෙන්නේ නැහැ කියලා, මට නම් රිදෙනවා!'' වැඩ බැරියා බෙරිහන් දෙයි.

''කෑ ගහන්ට එපා! තවත් එක ලී පතුරයි ඉතුරු වෙලා තියෙන්නේ. ඒකත් ගළවා දමන්නම්!''

''අපොයි, එපා! ඒක එහෙම තිබුණාවේ! ගළවන්ට එපා.''

''එහෙම බැහැ. ඒක පැසවන්ට පුළුවනි.''

''අනේ අම්මෝ, රිදෙනවෝ!''

''ඔන්න ගළවා දැම්මා! දැන් ඉතින් අයිඩින් ගාන එක විතරයි.''

''අයිඩින් ගෑවාම රිදෙනවද?''

''නැහැ. කිසිම වේදනාවක් නැහැ. නුඹ කලබල නැතුව ඉඳපන්,'' දොස්තර කියුවේය.

''අයියෝ!''

''කෑ ගහන්නේ නැතුව ඉන්නවා! කාර් එකේ නැගලා රවුම් ගහන්ට පුළුවනි. වේදනාව ටිකකටවත් උහුලන්ට බැහැ!''

''අනේ අම්මෝ, ඇඟ දනවෝ!''

''පොඩ්ඩක් දනවා වගේ දැනේවි. පසුව ඇරිල යාවි. දැන් මම උණ බලන කටුව තියන්නම්.''

''උණ කටුව එපා. අනේ එපා!''

''ඒ මොකද?'' දොස්තර ඇසීය.

''මට රිදෙන්ට පුළුවනි.''

''උණ කටුවට රිදෙන්නේ නැහැ මිනිහෝ!''

''දොස්තර කිව්වට රිදෙන්නේ නැහැ කියලා. පසුව හැබැටම වේදනාව ඇතිවෙනවා.''

''හැබෑ කොල්ලෙක්! නුඹගෙ උණ බලන්ට මම කවදාවත් උණ කටුවක් තියලා නැද්ද?''

''නැහැ.''

''එහෙනම් නුඹට දැනේවි, උණ බලන විට කිසිම වේදනාවක් නැති බව.''



එඬරු තෙල් දොස්තර එසේ කියා උණ කටුව ගැනීමට යාබද කාමරයට ගියා.

වැඩ බැරි ආස වහාම ඇඳෙන් නැගිට, ජනේලයෙන් පිටතට පැන තම මිතුරා වන ගුණේ හමුවීමට ගියා. දොස්තර උණ කටුවත් රැගෙන එන විට වැඩ බැරි ආසත් එතැන නොසිටි නිසා මුමුණමින් මෙහෙම කියුවා:

''ඔන්න ඉතින් ඔය වගේ ලෙඩකුව සුව කරන්නේ කොහොමද! එයාට බෙහෙත් ප්‍රතිකාර කරන විට එයා ජනේලයෙන් පැනලා දුවනවා. ඒක මහා නොහොබිනා වැඩක්!''



**Н. Носов**

КАК НЕЗНАЙКА КАТАЛСЯ
НА ГАЗИРОВАННОМ АВТОМОБИЛЕ

*на языке синхала*



© සිංහල අනුවාදය සහ චිත්‍ර, රාදුගා
ප්‍රකාශකයෝ, 1985





වැඩ බැරී දාසගේ හපන්කම් ගැන ඔබ වැඩිදුරටත් සැලකිලි දක්වති නම්, කුසුම් පුරයේ වැසියන් ගැන දැන ගැනීමට ඔබ ආශා කරති නම්, මෙම පොත් පෙළට අයත් අනික් පොත් කියවන්න:

**ගුවනේ පාවෙන බැලූමක් සෑදීමට දක්ස පාල කල්පනා කළ සැටි. සංචාරය සඳහා සූදානම් වීම.**

Rs 40/ -

ISBN 5—05—000314—8